# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII FEBRUARY 2024 Issue No. 03


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 112:1 - 10)

01. ස්වාමීන්ට ප්‍රශංසාකරව්. ස්වාමීන් කෙරෙහි භයවන්නාවූ උන්වහන්සේගේ ආඥාවලට ඉතා ප්‍රියවන්නාවූ මනුෂ්‍යයා පිනැත්තේය.

02. ඔහුගේ වංශය පොළොවෙහි බලවත්වන්නේය. අවංකයන්ගේ පරම්පරාව ආශීර්වාද ලබන්නේය.

03. සම්පත්ද වස්තුද ඔහුගේ ගෙයි ඇත්තාහ. ඔහුගේ ධර්මිෂ්ඨකම සදාකල් පවත්නේය.

04. සත්පුරුෂයාට අන්ධකාරයෙහිදී ආලෝකය උදාවේ. ඔහු දයාවන්තය, අනුකම්පාවෙන් පූර්ණය, ධර්මිෂ්ඨය.

05. කරුණාකරන, ණයට දෙන මනුෂ්‍යයාට ශුභසිද්ධවේ; ඔහු විනිශ්චයේදී තමාගේ කාරණය ඉෂ්ටකරගන්නේය.

06. මක්නිසාද ඔහු කිසි කලෙකත් නොසෙල්වන්නේය; ධර්මිෂ්ඨයා සදාකල්ම සිහිකරනු ලබන්නේය.

07. ඔහු නරක ආරංචිවලට භය නොවන්නේය. ඔහුගේ සිත ස්වාමීන් කෙරෙහි විශ්වාසය තබමින් ස්ථිරව තිබේ.

08. ඔහුගේ සිත සවිව තිබේ, තමා කැමති ලෙස විද්‍රිකාරයන්ට සිදුවෙනවා දකිනතුරු ඔහු භය නොවන්නේය.

09. ඔහු විසිරවූයේය, දිළිඳුන්ට දුන්නේය; ඔහුගේ ධර්මිෂ්ඨකම සදාකල් පවත්නේය. ඔහුගේ අඟ ගෞරවයෙන් උසස්වන්නේය.

10. දුෂ්ටයා ඒ දැක ශෝකවන්නේය; ඔහු දත්මිටිකා පහව යන්නේය. දුෂ්ටයන්ගේ ආශාව ඉෂ්ට නොවන්නේය.

# දෙවියන්වහන්සේගේ හස්තය ඔබගේ යහපත උදෙසාය!

(දේවගැති ඒන්ජල් සෙල්වකුමාරි)

## GOD'S HAND IS UPON YOU FOR GOOD!



*''මාගේ දෙවියන්වහන්සේගේ යහපත් හස්තය මා කෙරෙහි තිබෙන බවද....'' (නෙහෙමියා 2:18)*

'දෙවියන්වහන්සේගේ හස්තය' යන පදය පරණ ගිවිසුම තුළ අවස්ථාවන් 36 කදී 39 වන වතාවක්ද 3 වතාවක් අලුත් ගිවිසුම තුළද සඳහන්කර තිබේ. තවද, ''ස්වාමීන්වහන්සේගේ හස්තය'' යන පදය පරණ ගිවිසුම තුළ 7 වතාවක්ද අලුත් ගිවිසුම තුළ 9 වතාවක්ද සඳහන් කර තිබේ.

පරණ ගිවිසුම් කාලයේ පමණක් නොව වර්තමානයේදී ද දෙවියන්වහන්සේගේ හස්තය බලවත්ව හා සුවිශේෂීව තිබේ. දෙවියන්වහන්සේගේ හස්තය අපගේ ජීවිතයට සුවිශේෂී වන්නේ ඇයි?

- ★ ***ක්‍රියා 7:50*** හි සඳහන් වන ආකාරයට සියල්ල උන්වහන්සේගේ හස්තයෙන් සාදනු ලැබීය.
- ★ යාබෙශ් මෙම සුවිශේෂීභාවය ගැන හොඳින් දැන සිටි නිසා, 'ඔබගේ දෑත මා කෙරෙහි තැබුව මැනව' කියා පවසනු ලැබුවේය. දෙවියන්වහන්සේගේ හස්තය අපගේ ජීවිතයේ සෑම ක්‍රියාවක් සමඟමත් අපගේ ජීවිතයේ සියමලු ස්ථාන වලත් තිබෙන බව පමණක් නොව උන්වහන්සේගේ හස්තය අපගේ ජීවිතයේ ඉතා මහත් වූ වෙනසක්ද ඇති කරයි. අප කී දෙනෙක් මෙය අත්දැක තිබේද?

*3 වෙනි පිටුවට ...*




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)



REACHING NATIONS

## from your dearly beloved brother...

# කැඳවීමේ ප්‍රතිරාවය



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**HON. EDITOR-IN-CHIEF**

Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**MANAGING EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.

**ADMINISTRATION**

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**

Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Sis. L. Mariya Anjalin, M.A., M.Sc., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran

**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858

**E.MAIL**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**

Echo of His Call

**"මම හැරී ගිය කල, ගඟ බඩ දෙපැත්තෙන්ම බොහෝ ගස් තිබෙනවා දුටිමි" (එසකියෙල් 47:7))**

**යේසුස් වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**

අපගේ ස්වාමීවූ ගැලවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝවූ නාමයෙන් ඔබට සුභ පතමි !

කැඳවීමේ ප්‍රතිරාවය සේවය උදෙසා ඔබ නොකඩවාම කරගෙන යන්නාවූ ඔබගේ යාච්ඤාව හා උපකාරය නිසා අපගේ හෘර්දයාංගයෙන්ම නැගෙන ස්තූතිය පුද කරමි. සැබවින්ම ඔබගේ කැපවීමට දෙවියන්වහන්සේ ආශිර්වාද කරන්නේය.



*St. Paul's Matriculation School Teachers*


පසුගිය උත්සව සමය නිසා (නත්තල, අලුත් අවුරුද්ද සහ සබත් පාසැල් දරුවන්ගේ වාර්ෂික නත්තල් වැඩසටහන) අප බොහෝ රැස්වීම් මාලාවන් විවිධ ස්ථාන වල එනම්, සංතෝෂපුරම්, බාලාජිනගර්, වේලච්චේරි ආදී ස්ථාන වල පැවැත්වුවෙමි. මේ පිළිබඳව අප ඉතාම හොඳ ප්‍රතිචාර ලැබුණි. බොහෝ දෙනෙකුගේ ජීවිත වලට දෙවියන්වහන්සේ අත ගැසුවේය.

එසේම මෙම නව වසරේදී අප කිරීමට යන්නාවූ සෑම වැඩසටහනක්ම ඔබගේ යාච්ඤාවේදී මතක් කරන්න.



*Senior Pastor's Field Ministry in villages*

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development



*Pastor Sam with Team working for Accreditation from ATA*

ආසියානු දේව ධර්මාචාර්ය සංවිධානය (ATA) විසින් නෙහෙමියා බයිබල් විද්‍යාලය සාමාජිකත්වය දෙන පිණිස අවශ්‍ය වැඩකටයුතු ඉතා කඩිනමින් කරගෙන යනු ලබයි. මෙය සාර්ථකව කරගෙන යන පිණිස ඔබගේ යාච්ඤාව ඉතාම අත්‍යවශ්‍ය තිබේ. නෙහෙමියා බයිබල් විදුහල පුස්ථකාලයට හින්දි භාෂාවෙන් දේව ධර්මාචාර්ය පොත් අවශ්‍යව ඇත. එයට අදාල පොත් ඔබ ළඟ තිබේ නම් ඒවා අප වෙත ලැබෙන්නට සලස්වන්න.

පසුගිය වසර දෙස නැවත හැරී බලන විටදී අපගේ සමහර සේවකයින් ශාරීරිකව රෝගී තත්වයන්ගෙන් පෙලුනු නිසා ඔවුන් මහත් වූ අභියෝග තත්වයක සිටියේය. අපගේත් ඔබගේත් යාච්ඤාව කරණකොට ගෙන දෙවියන්වහන්සේ ඔවුන්ට ඉතා හොඳ සුවයක් දී තිබේ. තවත් අයට ඔබගේ යාච්ඤාව හා උදවු උපකාරය අවශ්‍යව ඇත.

අප ඉදිරියට යන ගමනේදී මෙම සේවය උදෙසා ඔබගේ නොකඩවා යාච්ඤාව අප ඔබගෙන් බලාපොරොත්තු වෙමු. ඔබ වෙනුවෙන්ද අප යාච්ඤා කරන බවට පොරොන්දු වෙමු.

දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබට ලැබේවා

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

## Kind Attention: Echo of His Call Readers

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

*1 පිටුවෙන්....*

- *''මාගේ කාලයන් ඔබගේ අතේය'' (ගීතාවලිය 31:15)*
- *''අප ඔබගේ හස්තකර්මාන්තය.'' (ගීතාවලිය 138:18)*
- *''ගුවන්තලය ස්වාමීන්වහන්සේගේ හස්තකර්මාන්තය දක්වයි.'' (ගීතාවලිය 19:1)*
- ඔබත් මමත් අපගේ දෑත් එකතු කර ස්වාමීන්වහන්සේගේ දෑත් මත තැබූ විට අපගේ ජීවිතවල ඉතා සැලකිය යුතු වෙනසක් සිදුවෙනු ඇත.

දෙවියන්වහන්සේගේ හස්තය කරන්නාවූ ක්‍රියාවන් සමහරක් අපි බලමු.

## (1). නිර්මාණශීලී දෑත් !

ස්වාමීන්වහන්සේගේ හස්තය කරණකොට ගෙන සියලු මැවිල්ලම මැවූ සේක. ***උන්වහන්සේ නැති දේ ඇති දේ මෙන් කරන්නාවූ දෙවියන්වහන්සේයි. (රෝම 4:17)*** උන්වහන්සේගේ දෑතින් අලුත් දේ නිර්මාණය කිරීමට පුළුවනි. උන්වහන්සේ මැවුම්කාර දෙවියන්වහන්සේයි. එපමනක්ද නොව උන්වහන්සේගේ දෑත් කරණකොටගෙන මැරුණ දේ නැවත ජීවනයට පත් කිරීමට පුළුවනි. උන්වහන්සේ මිය ගිය පුද්ගලයෙකුගේ දේහයට අත තැබූ විට ඔහුට ජීවනය ලැබුණි. බලාපොරොත්තු නැති අයට උන්වහන්සේගේ දෑත් වලින් බලාපොරොත්තුවත් නැවත ඔහුට ජීවනයත් ලබා දී එය සාර්ථකවීමටත් සලස්වයි. උන්වහන්සේගේ දෑතේ බලය නම්, මෙයයි. නායින් නුවර වැන්දඹුවගේ මියගිය පුතාගේ දේහයට උන්වහන්සේ අත ගැසූ විට ඔහුට නැවත ජීවනය ලැබුනේය. ඇයගේ නැති වූ බලාපොරොත්තුව නැවත ඇයට දෙමින් ප්‍රීතියත්, ඇදහිල්ලත් උන්වහන්සේ ඇයට ලබා දුන්නේය.

යේසුස් වහන්සේ උන්වහන්සේගේ දෑත් දිගුකර දෙනයට අත ගැසූ කල්හි දෙනය උසුලාගෙන ගියාවූ අය නැවතුනේය. එවිට, යේසුස්වහන්සේ කථාකොට ***''යෞවනය, නැගිටපන්නැයි නුඹට කියමි...'' කියා පැවසීය. (ලූක් 7:14-15)***

අප තවමත් මේ වර්ෂයේ ගත කරනු ලබන්නේ මුල් කාලයේය. අපට තිබෙන්නාවූ ස්වභාවික හැඟීම නම්, අපට තිබෙන්නාවූ අභියෝග වලට වලට අප මුහුණදෙනු ලබන්නේ කෙසේද? කියාය. සමර විට ඔබගේ ජීවිතයේ සියල්ල නැති වී අවසානයට පැමිණ සිටිනවා විය හැකිය. ඊළඟ පියවර ඔබ කුමක් කල යුතුද කියා නොදැන සිටිනවා විය හැක. මේ වසරේ එක් මාසයක් ගතවුවද අප ඉදිරියේ තිබෙන්නාවූ සිදුවීම් දෙස බලන විටදී අප මේවාට මුහුණ දීමට යන්නේ කෙසේද කියා ඔබ සිතනවා ඇත.

ප්‍රිය මිත්‍රය, ඔබගේ ජීවිතයේ මලානික වූ ස්ථාන වලට දෙවියන්වහන්සේගේ හුස්ම ලැබෙන පිණිස ස්වාමීන්වහන්සේට ඔබ කැපවෙන්න. දෙවියන්වහන්සේගේ හස්තය ඔබගේ ජීවිතයේ සෑම ස්ථානයකටම අත ගසා නැති වූ දේවල් නැවත නිර්මාණය කිරීමට ඉඩ දෙන්න.

## (2). සම්පූර්ණ කරන්නාවූ හස්තයක් !

*(ගීතාවලිය 145:16)*

දෙවියන්වහන්සේගේ හස්තය තෘප්තියට පමුණුවා අපගේ සියලු කාරණාවන් සම්පූර්ණ කරන සේක. උන්වහන්සේගේ සෙනඟගේ ආශාවන් උන්වහන්සේ ඉශ්ඨ කරන සේක. *ගීතාවලිය 145:19* හි

මෙසේ පවසයි. *''උන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ගේ ආශාව ඉෂ්ටකරනසේක...''* තවද ගීතාවලිය 37:4 හි මෙසේ පවසයි. ***''ස්වාමීන් කෙරෙහි ප්‍රීතිමත් වෙව, උන්වහන්සේ තාගේ සිතෙහි ආශාවන් ඉෂ්ඨකරනසේක....''*** අප මෙම පද කියවන බොහෝ අවස්ථාවන් වලදී දෙවියන්වහන්සේ අපගේ සෑම ආශාවක්ම එනම්, අපගේ හදවතේ ඇති වෙන්නාවූ සියලු ආශාවන් ඉෂ්ඨ කරන්න ඕනිය කියා බලාපොරොත්තු වෙයි. නමුත් සෑම දේම නොලැබෙන විට අප කලකිරීමට පත්වී දෙවියන්වහන්සේගේ වචනයෙහි පවසා ඇති පරිදි උන්වහන්සේ අපට පිළිතුරු දුන්නේ නැහැ කියා දුක් වෙයි.

ප්‍රිය මිත්‍රවරුනි, මේපදය අප කියවන විටදී එක් දෙයක් අපි තේරුම් ගැනීමට අවශ්‍ය වෙයි. අපව සම්පූර්ණ කරනු ලබන්නේත් අපව තෘප්තියට පත් කරනු ලබන්නේත් දෙවියන්වහන්සේම පමණි. නමුත් මේ දේ ලැබෙන්නේ ස්වාමීන්වහන්සේට භයවෙන්නාවූ අයට පමණි. මන්ද දෙවියන්වහන්සේට භයවී සිටින්නෝ උන්වහන්සේටම අයිති අයයි. එබැවින් ඔවුන්ගේ සිතේ ආශාව ස්වාමීන්වහන්සේ සම්පූර්ණ කරන සේක.

ඉශ්‍රායෙල් සෙනඟව දෙවියන්වහන්සේ මිසර දේශයෙන් පිටතට ගෙනා කල්හි ඔවුන්ට මස් කෑමට ආශා විය. මන්ද ඔවුන් මිසර දේශයේ සිටි විටදී ආහාර ගනු ලැබූයේ මස් සමඟයි. ස්වර්ගයෙන් දෙනු ලැබූ මන්නා ගැන ඉශ්‍රායෙල් සෙනඟ තෘප්තියට පත්වූයේ නැත. නමුත් ඔවුන්ගේ හදවතේ ආශාව අනුව දෙවියන්වහන්සේ ඔවුන්ට ආහාර පිණිස මස් ලබා දුන්නේය. ඒ ආකාරයට ඔබවත් මාවත් සෑම ආකාරයෙන්ම තෘප්තියට පත් කිරීමට දෙවියන්වහන්සේ කැමතිය. නමුත් මේ ආශිර්වාදය ලැබෙන්නේ උන්වහන්සේට භයවී උන්වහන්සේගේ මාර්ගයේ ගමන් කරන්නාවූ අයට පමණි. දෙවියන්වහන්සේට භයවෙන්නාවූ පුද්ගලයා ස්වාමීන්වහන්සේගේ හදවත හොඳින්ම හඳුනන්නාවූ පුද්ගලයෙකි.

දෙවියන්වහන්සේගේ හස්තය ඔබගේ ජීවිතය තුළ බලවත් ලෙස ක්‍රියාකර ඔබව තෘප්තියට පත්කර සම්පූර්ණත්වයට පත් කිරීමට නම් ස්වාමීන්වහන්සේට භයවෙන්න.

## 3. උසුලන්නාවූ දෑත් !

භය නොවෙන්න

*''මනුෂ්‍යයෙකුගේ ගමන් ස්වාමීන් කරණකොටගෙන ස්ථිරවෙයි. උන්වහන්සේ ඔහුගේ මාර්ගය ගැන ප්‍රීතිවන සේක. ඔහු වැටෙන නුමුත් සහමුලින්ම හෙළනු නොලබන්නේය. මක්නිසාද ස්වාමීන්වහන්සේ ස්වකීය හස්තයෙන් ඔහුට ආධාර කරන සේක.'' (ගීතාවලිය 37:23-24)*

ධර්මිශ්ඨයා වැටෙන කල්හි ස්වාමීන්වහන්සේගේ හස්තය ඔහුව උසුලාගන්නේය.

***''භය නොවෙන්න, මක්නිසාද මම නුඹ සමඟ සිමමි. තැති නොගනින්න, මක්නිසාද මම නුඹේ දෙවියන්වහන්සේය. මම නුඹ ශක්තිමත් කොට, නුඹට උපකාර කරන්නෙමි. එසේය, මාගේ ධර්මිශ්ඨකම නැමැති දකුණතින් නුඹ උසුලන්නෙමි..... මක්නිසාද නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වන මම, භය නොවෙන්න, මම නුඹට පිහිටවන්නෙමියි කියමින් නුඹේ දකුණත අල්ලන්නෙමි.''*** *(යෙසායා 41:10 - 13)*

මම යෞවණියක්ව සිටි කල්හි මගේ පියා සමඟ සේවාවන් සඳහා නාගර්කෝවිල් යන ස්ථානයට ගියෙමි. අප නැවත නිවසට පැමිණීමට 600 Km පමණ දුරක් ගෙවා පැමිණිය යුතු අතර එම මාර්ගයේදී විශාල පාලමක් උඩින්ද, අපට ගමන් කිරීමට සිදු විය. එදින වැහිබර කාලගුණ තත්වයක්ද පැවතුනි. අප පාලම උඩින් ගමන් කරන විටදී වතුර මට්ටම ඉහළට නගින බවද මා දුටුවෙමි. අහසින්ද ඇද හැලෙන්නාවූ මහත් වරුෂාවක් තදින් හමන සුළඟත් යන මේ සියල්ල දුටු විට මා මහත් භීතියට පත්විය. නමුත් එම අවස්ථාවේදී මගේ කරට අතක් දමා මාව වැළඳගත්තේය. ඒ මගේ පියාගේ දෑත්ය. එම අවස්ථාවේදී පියා මෙම වචනය නොකීවත් මට හැඟුන දෙය නම්, ***''භිය නොවෙන්න, මා ඔබත් එක්කම ඉන්නවා. කිසිම දෙයක් ඔබට බාධා වෙන්නේ නැහැ.''*** යන්නයි. මගේ පියා මාව තදින්ම වැළඳ ගත් විටදී මට දැනුන හැඟීම නම් මෙයයි. ඉන්පසුව මා භියට පත් නොවීය.

මා ප්‍රිය මිත්‍රවරුනි, දේව වචනය තුළදී උන්වහන්සේ මාව දරාගන්නවාය කියා පැවසීමෙන් අදහස් කරනු ලබන්නේ උන්වහන්සේගේ බලවත් වූ හස්තයෙන් එනම්

***6 වෙනි පිටුවට....***


# NEHEMIAH BIBLE

**RESIDENTIAL / EVENING COLLEGE,**

Velachery / Chepauk & Santhoshapuram, Chennai.

Medium : Hindi / Tamil

Registered Candidate for Membership

Asia Theological Association (ATA)

Recognised by International Christian Leaders & Senior Pastors for the past 54 years

**Certificate in Ministry**

**Diploma in Theology**

Qualification : 10th Standard & above

**Rush for admission!**

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.

Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org

✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**පෙබ:19-** යාච්ඤා සේවය, ඇදහිල්ලේ සේවය මහා නියෝගය ඇතුළු සෑම සේවයකටම සම්බන්ධ සහායකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:20-** කැඳවීමේ ප්‍රතිරාවය U Tube සමාජ ජාලයට සම්බන්ධ සියලුම සේවා ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:21-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සියලුම සහකාර කතෘවරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:22**- කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සියලුම සේවකයන්ගේ පවුලේ අයට දිව්‍යමය ආරක්ෂාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:23-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය, මුද්‍රණාලය සහ එහි ක්‍රියාකාරකම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:24-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ දේවධර්ම පාඨමාලාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:25-** ඉරුදින දේව මෙහෙයන් වලදී දේව වචනය බලවත්ව ප්‍රකාශ කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:26-** යාච්ඤාවෙන් සහ මුල්‍යමය උපකාර සැපයීමෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවය ඉදිරියටත් කරගෙන යාමට උපකාරීවූ සෑම දෙනා ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:27-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු බලවේග වලින් ආරක්ෂා කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:28-** ශාන්ත පාවුළු මෛත්‍රීකුලේසන් විදුහල, නෙහෙමියා බයිබල් විදුහල, දේවධර්ම පාඨමාලාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**පෙබ:29-** පසුගිය වසරේ තවම ගෙවා අවසන්නොකල බිල්පත් ගෙවීමට හැකිවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:01-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු සියලුම දේව සේවකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:02-** දේව සේවයට තරුණ තරුණියන්ගේ කැපවීම ගැන ස්තුති කරන්න

**මාර්:03-** ශාන්ත පාවුළු මෛත්‍රීකුලේසන් විදුහලේ විදුහල්පතිතුමා සහ ගුරුවරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මාර්:04-** සියලු ජාතීන්ගේ එක්සත්කම සහ සමාදානය උදෙසා යාච්ඤා කරන්න

**මාර්:05**- කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුම සහයකයන් ගැන යාච්ඤා කරන්න

**මාර්:06-** සෑම ගම්මානයකම ශුභාරංචිය ප්‍රකාශ කිරීමට හැකිවන පිනිස යාච්ඤා කරන්න

**මාර්:07-** දේව සේවයේ සියලුම ක්‍රියාකාරකම් ගැන යාච්ඤා කරන්න

**මාර්:08-** දේව සේවයේ සියලුම අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න

**මාර්:09-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සහකාර කතෘවරියක් වන සජිනිගේ සෞඛ්‍යය ගැන යාච්ඤා කරන්න

**මාර්:10-** නව කොරෝනා වෛරස් ප්‍රභේද වලින් සියලුම ජනතාව ආරක්ෂා වීම ගැන යාච්ඤා කරන්න

**මාර්:11-** තරුණ තරුණියන් සහ දරුවන් තම ගැලවුම්කරු ලෙස යේසුස් වහන්සේව පිළිගැනීමට ඉදිරිපත්වීම ගැන යාච්ඤා කරන්න

**මාර්:12-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ට තම ජීවිත කථාව ලියා අවසන් කිරීමට අවශ්‍ය මගපෙන්වීම ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**මාර්:13-** වැඩිහිටි නිවාස වල ජීවත්වන වැඩිහිටියන් ගැන යාච්ඤා කරන්න

**මාර්::14-** අන්තර්ජාලය තුළ ඇති මාර්ගගත ක්‍රීඩා (Online Game) වලින් දරුවන් ආරක්ෂා කරගැනීම ගැන යාච්ඤා කරන්න

**මාර්:15-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සහකාර කතෘවරුන් ගැන යාච්ඤා කරන්න

**මාර්:16-** සෑම දේශයකම ආර්ථික ප්‍රශ්න වලට දෙවියන්වහන්සේ මැදිහත් වන පිනිස යාච්ඤා කරන්න

**මාර්:17-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු බලවේග වලින් ආරක්ෂා කරගැනීම පිනිස යාච්ඤා කරන්න

**මාර්:18-** මිෂනාරි සේවයේ යෙදෙන සියලුම ප්‍රදේශ වලට දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිනිස යාච්ඤා කර

*4 පිටුවෙන්....*

උන්වහන්සේගේ බලවත් දැතින් උන්වහන්සේ අපව රැගෙන යනවා නම් අප කිසි දෙයකට භය විය යුතු නැත. කනස්සල්ලට පත් විය යුතු නැත. ස්වාමීන්වහන්සේ අපගේ දැත් අල්ලාගෙන සිටින බවත් උන්වහන්සේගේ සමාදානය අප හා සමඟ තිබෙන බවත් මතක තබාගත යුතුය. පාවුල් හා සීලස්ගේ දැත් වලට දම්වැල් දමා ඔවුන්ට තලා, හිරගෙදරට දමා තිබූ විටදී ඔවුන්ට තිබුනේද මෙම සමාදානයමයි. දෙයවින්වහන්සේගේ හස්තය අපව දරාගන්නා තෙක් අපට ඕනෑම ස්ථානයක ඇවිදින්නට පුළුවනි. එනිසා ගීතාවලිය පොතෙහි මෙසේ පවසනු ලබයි. *''එසේය, මරණ සෙවණේ මිටියාවත මැදින් යන්නෙමි, නමුත්, කිසි උපද්‍රවයකට භය නොවන්නෙමි, මක්නිසාද ඔබ මා සමඟය...'' (ගීතාවලිය 23:4)* මෙම වසර මුලුල්ලේම දෙවියන්වහන්සේ ඔබව දරාගෙන ඔබගේ සෑම අවස්ථාවකදීම ඔබට ශක්තිය දරාගෙන ඔබගේ සෑම අවස්ථාවකදීම ඔබට ශක්තිය හා සමාදානය දෙමින් ඔබගේ දැත් අල්ලාගෙන යන බව මා විශ්වාස කරමි.

මේ ගමන ඔබ ගමන් කරනු ලබන්නේ තනියම නොවේය. ඔබ හා සමඟ තවත් කෙනෙක් ගමන්කරයි. එනම්, උන්වහන්සේ ඊයේ සිදු වූ දේ දනී. අද සිදුවන දේත් දනී. එසේම හෙට දවසේදී ඔබට සිදුවීමට යන සියලුම දේත් උන්වහන්සේ හොඳින්ම දනී. එබැවින් ඔබ කනස්සල්ලට පත් නොවෙන්න. හෙට දවස ගැන භය නොවෙන්න. ඔබව ගෙනයන්නාවූ දෙවියන්වහන්සේ අවසානය දක්වාම ඔබව රැගෙන යන සේක.

## (4). බලවත් හස්තය !

උන්වහන්සේගේ හස්තය බලවත්ය. ඔබගේ පැත්තෙහි උන්වහන්සේ සිටින විට උන්වහන්සේගේ හස්තය ඔබ වෙනුවෙන් සටන් කරනවා ඇත. එවිට ඔබට ජයග්‍රහණය ගෙන දෙනවා ඇත.

*යෙසායා 19:16 හි මෙසේ පවසයි. ''ඒ දවසේ මිසරවරු ස්ත්‍රීන් මෙන් වී, සේනාවල ස්වාමීන්වහන්සේ විරුද්ධව සොලවන උන්වහන්සේගේ අතේ සෙලවීමට භයපත් වී, වෙවුලන්නෝය.''*

එනම්, දෙවියන්වහන්සේගේ හස්තයට විරුද්ධ කිසිවෙකුටවත් සිටගැනීමට බැරිය. එසේම ඔබ දෙවියන්වහන්සේට අයිති නම්, ඔබට විරුද්ධව නැගී සිටීමට කිසිවෙකුට බැරිය. දෙවියන්වහන්සේගේ හස්තය ඔබ හා සමඟ තිබෙනතුරු ඔබ ඉතාම ආරක්ෂා සහිතයි. නමුත් දෙවියන්වහන්සේගේ හස්තය අප හා සමඟ නැතිනම් අප බල රහිත වූ පුද්ගලයෙක් වෙයි.

## දෙවියන්වහන්සේගේ හස්තය අපට විරුද්ධව ක්‍රියා කරන්නේ කුමන මොහොතේද?

*''නුමුත් මායාකාර යන අර්ථය ඇති එලිමස් නම් තැනැත්තේ අධිපතියා ඇදහීමෙන් ඉවතට හරවාගන්නට අදහස් කරමින්, ඔවුන්ට විරුද්ධය සිටියේය. නුමුත් පාවුල් යන නමක්ද ඇති සාවුල් ශුද්ධාත්මයෙන් පූර්ණව, ඔහු දෙස ඇස් යොමා සියලු වංචාවෙන් හා සියලු දුෂ්ටකමින් පූර්ණවූ තැනැත්ත යක්ෂයාගේ පුත්‍රය, සියලු ධර්මිෂ්ඨකමට සතුරුවූ නුඹ ස්වාමීන්වහන්සේගේ හරි මාර්ගයෙන් පෙරළීමෙන් නවතින්නේ නැද්ද? ඉදින්, මෙන්න, ස්වාමීන්වහන්සේගේ හස්තය නුඹ පිට තිබේ, නුඹ අන්ධ වී කලකට ඉර නොදක්නෙහියයි කීවේය. එකෙනෙහිම දූමාරයක්ද අඳුරක්ද ඔහු පිටට පැමිණුනේය.'' (ක්‍රියා 13:8 - 11)*

දෙවියන්වහන්සේගේ බලවත් හස්තය කරණකොටගෙන ශුභාරංචියට විරුද්ධව සිටින අයට දෙවියන්වහන්ස්ද විරුද්ධව සිටින සේක.

ස්වාමීන්වහන්සේගේ සේවයට අප විරුද්ධවන කල්හිත් දෙවියන්වහන්සේගේ සේවය නතර කිරීමට ක්‍රියාකරන විටදීත් දෙවියන් වහන්සේගේ හස්තය අපට විරුද්ධව ක්‍රියා කරනු ඇත. දෙවියන්වහන්සේගේ ආලේපය ලැබූ අයට විරුද්ධව කථා නොකරන්න. අනවශ්‍ය පණිවිඩ දීම, කේලම් කීම, අනුන්ගේ වැරදි කථා කිරීම, දේව දාසයින්ට විරුද්ධව නැගී සිටින යන දේ කරන විට දෙවියන්වහන්සේගේ හස්තය අපට විරුද්ධව තිබේ.

අද අප අතර සිටින්නාවූ බොහෝ දෙනෙක් අඳුරේ ජීවත්වෙන්නේ දෙවියන්වහන්සේම ඔවුන්ගේ ඇස් අඳුරුකර තිබෙන නිසාය. දෙවියන්වහන්සේගේ සේවයට ඔබ කිසියම් ආකාරයකින් බාධාවක් වී තිබේ නම්, ඔබගේ ක්‍රියාවන් හෝ ඔබගේ වචන දේව සේවයට බාධාවක් වී තිබේ නම්, ඒ ගැන අප ප්‍රවේසම් වෙමින් උන්වහන්සේ වෙතට හැරෙමු. එසේ නොමැතිවුවහොත් දෙවියන්වහන්සේගේ හස්තය අපට විරුද්ධව තිබේ. දෙවියන්වහන්සේගේ හස්තය අපට පක්ෂපාතී නම්, අපට ජයග්‍රහණය තිබේ.

දෙවියන්වහන්සේගේ හස්තය අප හා සමඟ තිබේ නම්, උන්වහන්සේගේ හස්තය කරණකොටගෙන අපට ජයග්‍රහණය තිබේ. *''ස්වාමීන්ට අලුත් ගීතිකාවක් ගායනාකරව්. මක්නිසාද උන්වහන්සේ ආශ්චර්යයක් කලසේක. ස්වකීය දකුණු අතින්ද ශුද්ධවූ බාහුවෙන්ද තමන්වහන්සේට ගැළවීම ඉෂ්ටකරගතසේක.'' (ගීථාවලිය 98:1)*

ප්‍රිය දෙවියන්වහන්සේගේ දාසයිනි, සමහර විට ඔබ ගමන්කරන්නාවූ මාවත තනියම ගමන් කරන්නාවූ පාළුවූ මාවතක් වීමට පුළුවන. ඔබ කරන්නාවූ අමාරුම සේවය කිසිවෙක්වත් අගය කරන්නේ නැහැ කියා සිතනාවද? මනුෂ්‍යයන් මේවා නොදකින්නට පුළුවනි. නමුත් යේසුස් වහන්සේ ඔබව දකින සේක. උන්වහන්සේත් මෙම මාර්ගයෙහි ගමන් කල සේක. උන්වහන්සේවද ප්‍රතික්ෂේප කලේය. දොස් පැවසුවේය. ඔච්චම් කලෝය. අගෞරවයට පත් කලෝය, උන්වහන්සේවද තනි කලෝය. ඔබව කැඳවූ දෙවියන්වහන්සේ විශ්වාසවන්තයි.
උන්වහන්සේ ඔබ ගැන දනී. ඔබ වෙනුවෙන් සටන් කරයි. නිහඬ වෙන්න. උන්වහන්සේ ඔබගේ සෑම සටනකදීම ඔබ හා සමඟ සිටිමින් ඔබව පරාජයට පත් නොකර ජයග්‍රහණය දෙන පිණිස උන්වහන්සේගේ දෑත් ඔබ වෙනුවෙන් සටන් කරන සේක. උන්වහන්සේගේ බලවත් වූ හස්තය ඔබ සමඟ තිබෙන නිසා ඔබ අතිශයෙන්ම ජයගන්නේය.

## (5). හඬගැසීමේ දෑත්!

අවසාන ලෙස බලන විටදී දෙවියන්වහන්සේගේ හස්තය අපව හැඩගස්වන හස්තයකි. උන්වහන්සේ අපගේ කුඹල්කරුවාය. අප මැටිය. අපව හැඩගසනු ලබන්නේ දෙවියන්වහන්සේය. සමහර විට අප අකමැති වූවත් ස්වාමීන්වහන්සේට අවශ්‍ය ආකාරයට උන්වහන්සේගේ පාවිච්චිය සඳහා අපව හැඩගස්වයි.

දෙවියන්වහන්සේ අපව හැඩගස්වන විටදී එය ඉතාම සුව පහසු අත්දැකීමක් නොවන්නේය. සමහර විට අපට රිදෙන නමුත් එවැනි අවස්ථාවේදී අප දෙවියන්වහන්සේගේ හස්තයට මුළුමුනින්ම කැපවී උන්වහන්සේට විශ්වාස කල යුතුයි. අප එක් දෙයක් මුළුමුනින්ම මතක තබා ගත යුතුය. එනම්, දෙවියන්වහන්සේ අප ගැන හොඳාකාරයෙන්ම දනී.

අපගේ ජීවිතය හැඩගස්වන විටදී ප්‍රශ්න, කරදර හා අමාරුවූ අවස්ථාවන් අපගේ ජීවිතයට පැමිණෙන්නට සලස්වයි. අපව හැඩගස්වන පිණිස දෙවියන්වහන්සේ සමහර මිනිසුන්ව පාවිච්චි කරති. සමහර අය අපගේ ජීවිත වලට ඇතුලුවෙන්නේ අපට ඉවසීම ඉගෙන ගන්නා පිණිසය. ඔවුන් පිටකරන වචන තුළින් අපව ප්‍රකෝප කිරීමටද උත්සාහර දරයි. අපව හැඩගස්වන පිණිස ඔවුන්ව පාවිච්චි කරති. අප ඉවසීම උගන්වන පිණිස ගසක අතු කපා කප්පාදු කරන්නාක් මෙන් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැලැස්ම අප තුළ සම්පූර්ණ කරන පිණිසත් අපව නැවත අලුත් දලු දමා අපගේ ජීවිතයේ අලුත් දෙයක් කරන පිණිසත්, අපගේ අතුද කපා දමයි. බොහෝ අවස්ථාවන් වලදී අපගේ ජීවිතයට ලංවී සිටින්නාවූ බොහෝ අය අපගෙන් ඈත් වෙයි. අපිව හැර දමා යයි. මගේ ජීවිත කාලයේදී මා මෙය බොහෝ අත්දැක ඇත්තෙමි. එක් කාලයකදී සමහර මිනිස්සු අපට ලංවෙන්නේ ටික කාලයකට පමණි. සමහර මිනිසුන්ව දෙවියන්වහන්සේ අපගේ ජීවිතයට ලංකර දෙන්නේත් ඔවුන්ව ටික කාලයකිනි අපගේ ජීවිත වලින් ඈත් කරනු ලබන්නේත් අපව ශක්තිමත් කරනු ලබන පිණිසය. දෙවියන්වහන්සේ මේ සියල්ලටම හේතුන් දන්නේය.

සමහර අවස්ථාවන් වලදී දෙවියන්වහන්සේගේ බලවත් හස්තය අපව පොඩි කරන බව අපට දැනෙයි. මෙලෙස උන්වහන්සේ කරනු ලබන්නේ, අපව විනාශ කිරීමට නොව ඔබව හැඩගස්වන පිණිසයි. 1 පේතෘස් 5:6 හි මෙසේ පවසයි. *''එබැවින් දෙවියන්වහන්සේ සුදුසු කාලයේදී නුඹලා උසස් කරන පිණිස උන්වහන්සේ බලවත් හස්තයට යටත්වෙයල්ලා.''* දෙවියන්වහ්සේගේ බලවත් වූ හස්තය කොතරම් බලවත් වූ දේ කරයිද කියා අප ඉතා ඉවසීමෙන් යුතුව බලා සිටිමු.

අපගේ ජීවිතයේ සියලුම ආශාවන්, සිහින ආදී සියල්ලම දෙවියන්වහන්සේගේ බලවත් වූ හස්තය මත තබා බලා සිටිනවා නම්, සියලුම ආශිර්වාදයන් අපගේ ජීවිතයට එකතු වෙනවා ඇත.

*******



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## කරන්ට නුඹේ අතට සම්බවෙන සියල්ලම නුඹේ වීර්‍යයෙන් කරපන්න

හුළඟ බලා සිටින්නා නොවපුරන්නේය. වලාකුල් බලන්නා කපා නොගන්නේය.'' (දේශනාකාරයා 9:10, 11:24)

මගේ හදවතෙහි තිබූ දිගුකාලීන ආශාව නම්, බයිබලය ඉතා ගැඹුරෙන් ඉගෙන ගන්න ආශාවෙන් සිටින්නාවූ අයට තැපැල් මාර්ගයෙන් බයිබල් පාඩම් මාලාවක් සහ බයිබල් විද්‍යාලයක් ආරම්භ කිරීමයි. මෙම ආශාව මගේ හදවතෙහි මුල් ඇද තිබුණි. වසර ගණනාවක් පුරාම මාතුළ මෙම ආශාව වර්ධනය වෙමින් තිබුණිත නමුත් මා තනි වුනෙමි. මෙම සේවය ආරම්භ කිරීමට අවශ්‍ය මුදල් සොයා ගන්නා පිණිස මා බොහෝ වෙහෙස මහන්සි වූයෙමි. මෙම කාල වකවානුව තුලදී මා සහ මගේ පවුලේ අය බොහෝ අවශ්‍යතාවයන්ද සමඟ මහත් සේ දුක්බර වූ ජීවිතයක් ගත කලෙමු. අප සිටියේ කුලී නිවසක වූ අතර එහි කිසිදු පහසුකමක්ද නොතිබුණි.

1980 වැනි වර්ෂයේදී එක්තරා සංවිධානයකින් එනම්, ඉන්දියා බයිබල් සාහිත්‍ය සංගමය යන ආයතනයෙන් මා හට පාර්සලයක් ලැබුණි. මා එය විවෘත කල විටදී ඒ තුළ ශුභාරංචි පත්‍රිකා සහ තැපැල් මාර්ගයෙන් බයිබල් පාඩම් මාලාවන් කිරීමට පාඩම් මාලා පොතකුත් තිබුණි. මා එම පොත් දෙක දුටු විට එම පොත්ම ඉන්දියාවේ විවිධ භාෂාවන් වලින් පාවිච්චි කිරීමට තීරණය කලෙමි.

පසුව මා මෙම සංවිධානයේ කාර්‍යයාලයට ගියෙමි. එහිදී මා වේලායුදම් නැමති තරුණ පුද්ගලයාව මුණගැසුනෙමි. දැන් ඔහු එම සංවිධානයේ අධ්‍යක්ෂක තුමාය. ඔහු එම ස්ථානයෙහි පාඩම්මාලා පොත් සියල්ලම තැපැල් මාර්ගයෙන් යවන පිණිස සූදානම් කර තිබූ ආකාරය දුටු විට එවැනි දෙයක් කිරීමට මා හටද සිතුනි.

මා ඔහු ළඟට ගොස් එහි තිබූ සමහර පොත් මා හට ලබා දෙන්න පුළුවන්ද කියා ඇසුවෙමි. එවිට ඔහු එක් පොතක මිල ශත 50 ක්ය කියා පැවසුවේය. එවිට 'මා රාජ්‍ය සේවයේ රැකියාවක නියුතුව සිටිමි. මගේ පවුලත් ඉතාම දිළිඳුයි. එම රැකියාවෙන් ලැබෙන ඉතාම සුළු වැටුපෙන් තමයි මා සේවය කරන්නේ' කියා මා ඔහුට පැවසුවෙමි. මා පැවසූ කථාව ඇසූ ඔහු මට පොත් 10 ක් දුන්නේය. එහෙත් එයින් මා සෑහීමට පත් වූයේ නැත. එම් තිබූ ජනේලයෙන් එබී බැලූ විට එතැන තිබූ පොත් දෙස මා බලා සිටියා. මා එම පොත් දෙස බලන විටදී මා දුටුවේ මෙවැනි පාඩම් මාලාවක් මා සෑම ස්ථානයකටම බෙදාහරින බවයි. ඒ අවස්ථාවේදී යම් පුද්ගලයෙක් මට තට්ටුවක් දමා ''ඔබ කවුද?, ඔබ දිගු වේලාවක් අපගේ කාර්‍යයාලය දෙසම බලා සිටින්නේ ඇයි?'' කියා ඇසුවේය. එවිට මා ඔහුට පැහැදිලි කරමින්, මා යේසුස වහන්සේගේ සේවය කරන දුප්පත් කෙනෙකි. මෙම පාඩම් මාලා පොත් ගෙන අන් අයට බෙදා දීමට මට ලොකු ආශාවක් තිබෙනවා ය කියා ඔහුට පැවසුවෙමි. එවිට ඔහු මට මුදල් රැගෙන එන්න, එවිට පොත් ලබා ගන්න පුළුවන් කියා පැවසුවේය. මා එම වේලාවේම මෙතෙක් මා පාවිච්චි කරමින් සිටි පා පැදිය විකුණා මෙම පොත් ලබා ගැනීමට තීරනය කලෙමි.

මගේ පා පැදිය රුපියල් 100 ක මුදලකට ගරාජයකට විකුණා පාඩම් මාලා පොත් 200 ක් ලබා ගත්තෙමි. මා ළඟ තිබූ පා පැදිය විකුණු නිසා මෙම පොත් මගේ කරපිට තබාගෙන එතැන සිට මගේ නිවසට


**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

## PLEASE PRAY FOR OUR MINISTRIES AT THE HEAD QUARTERS

1. Prayer Service : 24 hours
2. **BIBLECOR** – Bible Correspondence Courses : English, Tamil & Hindi
3. **ECHO OF HIS CALL** – Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press – Publications
11. St. Paul's Matriculation School – Village English High School
12. Sunday Schools : 8.30 a.m. & 4.00 p.m. Sunday
13. **Tamil Services : 8.00 a.m. & 10.00 a.m. Sunday**
14. **Hindi Service : 4.00 p.m. Sunday**
15. **Telugu Service : 5.00 p.m. Sunday**
16. **English & Tamil Service : 6.00 p.m. Sunday**
17. Women's Prayer : 5.30 p.m. Wednesday
18. Men's Prayer : 7.00 p.m. Friday
19. Discipleship Meeting : 6.00 p.m. Saturday
20. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
21. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
22. Ministers Review Meeting : 5.30 p.m. First Saturday
23. Parents' Prayer : 4.00 p.m. First Sunday
24. Night Prayer : 9.30 p.m. Second Friday
25. Fasting Prayer : 9:30 a.m. Third Saturday
26. Holy Communion : Second Sunday Services
27. Youth / Kid Prayer : 10.00 p.m. daily
28. Staff Devotion : 9.00 a.m. daily
29. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

5Km ක පමණ දුරක් පයින්ම ගමන් කලෙමි. මෙවැනි බර මට උසුලාගෙන යාම නුපුරුදුය. මා බොහෝ වෙහෙස මහන්සියට පත් විය. අවස්ථාවන් දෙකකදීම මේ පොත් පාර්සලය මගේ කර පිට ගෙනයන විට බිමට වැටුණි. මිනිසුන් මා දෙස බලා සිනාසුනේය. එහෙත් මා බොහෝ අමාරුවෙන් එම පාර්සලය මගේ නිවසට ගෙන ආවේය.

අද සහෝදර එම්. පෝල් රාජ්ගේ උපකාරයෙනුත්, දෙවියන්වහන්සේ මා හට 'ඔබ උදෙසා නව ජීවිතය' යන පාඩම්මාලාවත් කැඳවීමේ ප්‍රතිරාවය සවස් කාලීන බයිබල් විදුහල ආරම්භ කිරීමටත් උපකාර කලේය.

ඔව්, මිත්‍රවරුනි, දේව රාජ්‍යය උදෙසා මගේ පරණ පා පැදිය විකිණීමටද සිදුවිය. මගේ මිත්‍රයින් සහ මගේ පවුලේ අය මට පැවසුවේ මෙය මෝඩ වැඩක්ය කියාය. නමුත් අද දෙවියන්වහන්සේ මා හට බොහෝ වාහන දී තිබේ. වරක් මා තනියම මගේ කර පිට පොත් උසුලාගෙන ගියෙමි. එය ඉතා වේදනාත්මක වූ අතුදැකීමකි. නමුත් අද දෙවියන්වහන්සේ මට වෑන්, බස් ආදී සියල්ලම ශුභාරංචි සේවය උදෙසා දී තිබේ.

ප්‍රිය මිත්‍රවරුනි, ඔබ ගැනත් ඔබගේ ආනගතය ගැනත් සැලැස්මක් දෙවියන්වහන්සේට තිබේ. ඔබගේ සෑම දෙයක්ම දෙවියන්වහන්සේට කැප කරනවා නම් දෙවියන්වහන්සේ ඔබට මහත් ලෙස ආශීර්වාද කරන සේක.

ඔබගේ සේවය උදෙසාත් යේසුස් වහන්සේ උදෙසාත් මහත් කැපවීම් කරන්න. දේව රාජ්‍යය සංකල්පය උදෙසා මහත් වූ දෙයක් කරන්න. දෙවියන්වහන්සේගේ අනර්ඝවූ ආශිර්වාදයට කිසිම සීමාවක් නැත. මේ දේ මතක තබා ගන්න.

අපට තිබෙන්නේ එක ජීවිතයයි, එය ඉක්මනට පහවී යයි. නමුත්, ක්‍රිස්තුස්වහන්සේ උදෙසා අප කුමක් කලාද එය සදහටම පවතියි !

*******

RNI NO. TN/SIH/2006/17846

## A good opportunity to get Echo of His Call monthly magazine at free of cost

If you could send the addresses of your friends / relatives through post, letter, e.mail, WhatsApp or phone to us, we will dispatch **Echo of His Call** monthly magazine to them at free of cost.

## URGENT

We require approximately 1000 Hindi Christian books for **our Nehemiah Bible Colleges**. Kindly inform us about the possibility of obtaining theological Hindi books.

Please stop sending books in English and Tamil languages. Thank you.

- Pr. S. Sam Selva Raj, Editor
+91-98412 71858

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd FEBRUARY 2024.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**